**සාමාන්‍ය සමය දසතුන්වන ඉරුදින | දේව ප්‍රකාශන** 28-06-15

## පළමුවන දේව ප්‍රකාශනය

ප්‍රඥ 1:13-15, 2:23-24

සලමොන්ගේ ප්‍රඥව නැමති පොතෙන් උපුටා ගත් කොටසකි.

**("යක්ෂයාගේ ඊර්ෂ්‍යාව නිසා මිහිපිට මරණය බිහිවිය.")**

මරණය දෙවිඳුන්ගේ ක්‍රියාවක් නොවේ. ජීවමාන අය වනසාලීමෙන් එතුමාණෝ ප්‍රීති නොවන සේක. එතුමාණන් සියල්ලක් මැව්වේ ජීවත් වන පිණිස ය. මිහි පිට මැවිලි සියල්ල යහපත් ය. ඒවා තුළ මාරක විෂ ගතියක් නැත. මරණයට මිහිතලය කෙරෙහි බලයක් නැත. දැහැමිකම අමරණීය ය. එහෙත්, දෙවිඳාණෝ මිනිසා නොමැරෙන සුලු කෙනෙකු කළ සේක. සිය ස්වරූපයට ඔහු මවා වදාළ සේක. ලොවට මරණය පැමිණියේ යක්ෂයාගේ ඊර්ෂ්‍යාවෙනි. ඔහුගේ හවුල්කාරයන් ද මෙය සොයා ගනු ඇත.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 30:1, 3-5, 10-12

පිළිතුර: සමිඳුනි, අපි ඔබට ප්‍රසංශ්ති ගී ගයමු.

ගීය: ඔබ මා උසස් කළ බැවින් ද මාගේ දුක් ගැන මාගේ සතුරන්ට ප්‍රීති වීමට නුදුන් බැවින් ද සමිඳුනි, ඔබට ප්‍රසංශ්ති ගී ගයමි. සමිඳුනි, ඔබ පාතාල යෙන් මා ගොඩගත් සේක. මා වළ පල්ලට නොයන පරිදි ඔබ මා දිවි රැකගත් සේක.

පින්වතුනි, සමිඳාණන්ට ගී පසස් නගන්න. ඒ නිර්මල නාමයට තුති ගී ගයන්න. මන්ද, එතුමන්ගේ උදහස ඇසිල්ලකට පමණ ය. එතුමන්ගේ කරුණාව දිවි ඇති තාක් ය. රැයේ හැඬිම පවතියි. උදය ප්‍රීතිය උදා වෙයි. සමිඳුනි, සවන් දී මට කරුණා කළ මැනව. ඔබ මාගේ සරණ වුව මැනව.

ඔබ මාගේ දොම්නස සොම්නසට හැරෙවූ සේක. ඔබ මාගේ ගෝනි රෙදි මුදා, තුටු පිළියෙන් මා සැරසූ සේක. දැන් ඉතින් මම නිහඬව නොසිටිමි. ඔබට ගී පසස් ගයන්නෙමි. මාගේ දෙවි සමිඳුනි, සදහටම ඔබ හට ගී ගයන්නෙමි.

## දෙවන දේව ප්‍රකාශනය

2 කොරින්ති 8:7, 9, 13-15

පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද දෙවන හසුනෙන් කොටසකි.

**("ඔබගේ වැඩිමනත්කමින් ඔවුන්ගේ අගහිඟකම් පිරිමසන්න.")**

ඇදහිල්ලෙන් ද කතාවෙන් ද දැනගැන්මෙන් ද උද්යෝගිමත් භාවයෙන් ද අප වෙත ඇති ඔබගේ ප්‍රේමයෙන් ද ඔබ පොහොසත් වී සිටින්නාක් මෙන් මේ සහනාධාර සේවයෙහි ද පොහොසත් වී සිටින්න. අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ත්‍යාගශීලී කරුණාව ඔබ දන්නහු ය. උන් වහන්සේ ධනවත් ව සිටි නමුත්, තමන් වහන්සේගේ දිළිඳුකම කරණකොටගෙන ඔබ ධනවත් වන පිණිස ඔබ උදෙසා දිළිඳු වූ සේක. මෙයින් අදහස් කරන්නේ ඔබ අමාරුවේ වැටී, අනුනට සහනය දීමක් නොව, සාධාරණකමක් ඇති වීමයි. දැන් ඔබගේ වැඩිමනත්කමින් ඔවුන්ගේ අගහිඟකම් පිරිමැසෙන්නාක් මෙන්, මතු ඔවුන්ගේ වැඩිමනත්කමින් ඔබගේ අගහිඟකම් පිරිමැසෙනු ඇත. මෙලෙස දෙගොල්ල අතර සාධාරණකමක් ඇතිවේ. මෙසේ: "වැඩියෙන් ලැබූ තැනැත්තාට වැඩි වූයේ වත් අඩුවෙන් ලැබූ තැනැත්තාට අඩු වූයේ වත් නැතැ"යි ශුද්ධ ලියවිල්ලේ ලියා තිබේ.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

2 තිමෝති 1:10

ආලේලූයා! ආලේලූයා! අපගේ මිදුම්කාරයාණන් වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ මරණයේ බලය බිඳදමා, ජීවනයත්, අමරණීය භාවයත්, සුබ අස්න මගින් හෙළි කර වදාළ සේක. ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 5:21-43

මාක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**( "සුළඟ ද මුහුද ද කීකරුවන මෙතුමා කවුරුක් ද?")**

ජේසුස් වහන්සේ යළිත් ඔරුවෙන් එතෙර වූ කල මහා ජනකායක් උන් වහන්සේ වෙත රැස් වූ හ. උන් වහන්සේ ද මුහුදු වෙරළෙහි වැඩසිටි සේක. එකල ධර්මශාලා ප්‍රධානීන් අතුරෙන් යායීරස් නමැත්තෙක් අවුත්, උන් වහන්සේ දැක, පාමුල වැටී, "මගේ පුංචි දුව මරණාසන්න ව සිටියි. ඈ සුවය ලබා ජීවත් වන පිණිස, ඔබ අවුත් ඈ පිට අත තැබුව මැනවැ"යි උන් වහන්සේට ආයාචනා කෙළේ ය. උන් වහන්සේ ඔහු සමග වැඩිය සේක. මහත් සමූහයක් උන් වහන්සේ තෙරපමින් උන් වහන්සේ පිරිවරා ගියහ.

දොළොස් වසරක් ම මහා ලේ රෝගයෙන් පෙළුණු ස්ත්‍රියක් එහි වූවා ය. ඈ බොහෝ වෙදුන් අතින් අපමණ දුක් විඳ, තමා සතු සියල්ල වියදම් කොටත්, කිසි ගුණයක් නොලැබුවා ය. එපමණක් නොව ඇගේ තත්ත්වය අනුක්‍රමයෙන් වඩ වඩාත් උග්‍ර විය. ඈ ජේසුස් වහන්සේ ගැන අසා, සමූහයා අතර පිටුපසින් ඇවිත්, උන් වහන්සේගේ වස්ත්‍රයට අත තැබුවා ය. උන් වහන්සේගේ වස්ත්‍රවලට පමණ වත් අත තැබුවොත්, තමාට සුවය ලැබෙනු ඇතැ යි ඈ සිතුවා ය. එකෙණෙහි ම ලේ ධාරාව නැවතී ඒ පීඩාවෙන් ඈට සුවය ලැබුණු බව ඇගේ ම ඇඟට දැනිණි. එවේලේ ම ජේසුස් වහන්සේ තමන් කෙරෙන් අනුහස නික්ම ගිය බව දැන, සමූහයා මැද හැරී, "මාගේ වස්ත්‍රවලට අත තැබුවේ කවරෙක් දැ"යි ඇසූ සේක. උන් වහන්සේගේ ශ්‍රාවකයෝ උත්තර දෙමින්, "සමූහයා ඔබට තෙරපි තෙරපී සිටිනු දැක දැකත්, මට අත ගැසුවේ කවරෙක් ද කියා අසන සේක් දැ"යි කී හ. ඒ දේ කෙළේ කවරෙක් දැ යි සොයනු වස් උන් වහන්සේ අවට බැලූ සේක. එහෙත් ස්ත්‍රිය සිදු වූ දේ දැක බිය වී, වෙවුළ වෙවුළා අවුත්, උන් වහන්සේ ඉදිරියෙහි වැඳ වැටී, මුළු ඇත්ත උන් වහන්සේට කීවා ය. උන් වහන්සේ කතා කරමින්, "දියණියනි, ඔබේ ඇදහිල්ල ඔබ සුවපත් කෙළේ ය; ශාන්ත සිතින් යන්න; ඔබේ පීඩාවෙන් මිදී වසන්නැ"යි ඈට වදාළ සේක.

උන් වහන්සේ මෙවදන් පවසත්ම ධර්මශාලා නායකයාගේ ගෙදරින් සමහරු අවුත්, "ඔබේ දුව මළා ය. ඉතින් ගුරුදේවයන් තවත් වෙහෙසන්නේ කුමට දැ"යි කී හ. එහෙත්, ජේසුස් වහන්සේ ඒ කීම නොසලකා ධර්මශාලා නායකයාට කතා කොට, "බිය නොවන්න, ඇදහිල්ල ඇති ව සිටින්නැ"යි වදාළ සේක. උන් වහන්සේ පේදුරු ද ජාකොබ් ද ජාකොබ්ගේ සහෝදර වූ ජොහන් ද හැර අන් කිසිවෙකුට තමන් සමග එන්න ඉඩ නුදුන් සේක. ඔව්හු ධර්මශාලා නායකයාගේ නිවෙසට පැමිණියෝ ය. එවිට උන් වහන්සේ කලබලයක් ද විලාප හා ළතෝනි නගන්නන් ද දැක, ගෙට පිවිස, "ඔබ කලබල වන්නේත්, විලාප කියන්නේත් මන් ද? දැරිය මැරී නැත; ඈ නිදන්නී ය"යි ඔවුන්ට වදාළ සේක. එවිට ඔව්හු උන් වහන්සේට සරදම් කළහ. එහෙත්, උන් වහන්සේ සියල්ලන් බැහැර කොට, දරුවාගේ පියා ද මව ද තමන් සමග සිටියවුන් ද කැඳවාගෙන දරුවා හුන් තැනට ගොස් ඇය අතින් අල්ලා, "තලිතාකුම්"යි ඈට වදාළ සේක. එහි අර්ථය; "දැරිය, මම ඔබට කියමි, නැඟිටින්න" යනු ය. දොළොස් හැවිරිදි ඒ දැරිය, එකෙණෙහි ම නැඟිට ඇවිද්දා ය. ඔව්හු ද ඉමහත් විස්මයකින් භ්‍රාන්ත වූ හ. මෙය කිසිවෙකුට නොදන්වන ලෙස ඔවුන්ට තදින් අණ දී, උන් වහන්සේ ඈට කෑමට යමක් දෙන්න නියම කළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.